# සමාජ නවීකරණය හමුවේ සාම්ප්‍රදායික වැදි ජන ජීවිතයට සිදුව ඇති බලපෑම් පිළිබඳ ව මානවවංශ විඃාත්මක අධ්‍යයනයක්

(රතුගල හා පොල්ලේබැද්ද ආදිවාසී ගම්මාන ඇසුරින්)

ගම්මහේගේවැව අමිත හිමි

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය
gmmahegewewaamitha@gmail.com

ප්‍රමුඛ පදඃශ්‍රී ලාංකීය උරුමය, ප්‍රාථමික ජන සමාජය, ආදීවාසි ජනතාව, සමාජනවීකරණය,සංස්කෘතික සන්දර්භය

## හැඳින්වීම

යම් ප්‍රදේශයක හෝ රටක ජීවත් වන පැරණිතම ජන කොට්ඨාසය ආදිවාසීන් වශයෙන් හඳුන්වයි. පිවමාන උරුමයක් වන ආදිවාසි ජනතාව ලෝකයේ බෝහෝ රටවල වාසය කරති. ශ්‍රී ලංකාව තුළ ද ආදිවාසීන් වාසය කරන අතර වර්තමානය වන විට නවීකරණය හා සමාජීය බලපෑම් හේතුවෙන් සම්ප්‍රදායික පිවිතයෙන් ඈත්වෙමින් සිටී. මුල් කාලීනව සබරගමුව පළාත ආශ්‍රිතව ජීවත් වූ ආදිවාසී ජනතාව වර්තමානයේ වැඩිපිරිසක් මහියංගනය, පොල්ලේබැද්ද, රතුගල ආදි ප්‍රදේශවල ව්‍යාප්ත වී ඇත. සම්ප්‍රදායික ජීවිකාවකට උරුම කම් කියන වැදි ජනයා අනන්‍යතාව රැක ගැනීමට උත්සාහ දරයි. එසේ වුවත් එම ප්‍රදේශ ආශ්‍රිතව සීග්‍රයෙන් සිදුවන සමාජ නවීකරණය හමුවේ එල්ල වන බලපෑම් හේතුවෙන් වැදි ජනතාව සම්ප්‍රදායිකත්වය අතහැර දමා සාමාන්‍ය ජන ජීවිතයක් ගත කරමින් සිටී. සමාජ නවීකරණය තුළින් ඇතිවන බලපෑම් පිළිබඳ ව රතුගල හා පොල්ලබැද්ද ආදිවාසී ගම්මාන ඇසුරින් සිදු කරන ලද අධ්‍යයනයක් තුළින් සාම්ප්‍රදායික ජන ජීවිතයට සිදුව ඇති බලපෑම් පිළිබඳ ව මෙහි දී අධ්‍යයනය කර තිබේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයේ දී ගුණාත්මක දත්ත රැස් කිරීම සඳහා සාහිත්‍ය මූලාශ්‍රය නිරීක්ෂණ, සහභාගිත්ව නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර ගවේෂණය කේවල අධ්‍යයන ආදී ක්‍රමවේද භාවිත කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රී ලංකාව විජයාගමනයට පෙර ජනාවාසකරණයට පත්ව ඇති බව පුරාවිද්‍යාත්මක පර්යේෂණ තුළින් මේ වන විට තහවුරු කරගෙන ඇත. රටක ජීවත් වන පැරණිතම ජන වර්ගය ආදිවාසීන් (Indigenons People) වශයෙන් හඳුන්වයි. ඕස්ට්‍රේලියාවේ ඇබෝජිවරුන්ට සමාන කම් කියන ලංකාවේ ආදිවාසීන් හඳුන්වන්නේ වැද්දන් ලෙසයි. දුන්නෙන් විද සතුන් දඩයම් කරන්නා බැවින් වැද්දා වන බැවින් ඔවුන් මෙතුළින්හඳුන්වනු ලැබේ. වැදි ජන සම්භවය පිළිබඳව කරුණු ඉදිරිපත් කරන සිරාන් දැරණියගල ගේ අදහස වන්නේ බලංගොඩ ආදි මානවයාගේ කායික ලක්ෂණ හා සමාන ලක්ෂණ වැදි ජනතාව තුළින් ද පිළිබිඹු වන බවය.

තමරට ආදිවාසී සම්භවය පිළිබඳව තොරතුරු රැසක් සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් වේ. මහාවංසයේ සඳන්වන පරිදි

ජීවහත්ථ හා දිසාලා යන කුවේණිගේ දරුවන්ගේන් ඔවුන් සම්භවය වී ඇත. මූලාශ්‍රයවල මොවුන් පුලින්ද වශයෙන් හඳුන්වා ඇති අතර ආර්යන් පැමිණීමට පෙර නොදියුණු ජනකණ්ඩායමක් වශයෙන් මෙ රට වාසය කළ බව ඉන් ගම්‍ය වේ. වැදි ජනයාගේ සම්බවය පිළිබඳ ව අදහස් රැසක් මූලාශ්‍රයවල සඳහන් වේ. එම සාධකවලින් අනාවර්ණය වන්නේ ශ්‍රී ලංකාවේ ආදීවාසී ජනතාව ලෝකයේ ඉපැරණිම ජන සම්භවයකට උරුමකම් කියන බවයි. ඔවුනට ම ආවේණික වූ භාෂාවක්, ඇදහිලි හා විස්වාස සමුදායක් ඇවතුම්පැවතුම්, අභිචාර විධි හා අධ්‍යාපන ක්‍රමවේද ආදි සංස්කෘතික ගතිකයන් රැසක් දක්නට ලැබේ.

ආදීවාසී ජනතාව විසින් සිය ජනාවස සිංහල හෝ දෙමළභාෂාව කතාකරන කණ්ඩායම්වලට පෙර මේ රට පිහිටුවා ඇති බව පුරාවිද්‍යා පර්යේෂණවලින් සනාථ වේ. වර්තමානයේ වුව ද ඔවුන් වනාන්තරවල පදිංචි වී සිටින අතර අතීතයේ සිට පවත්වාගෙන එන සංස්කෘතික අංගයන්වලට නවීකරණය හේතුවෙන් බලපෑම් එල්ල වී ඇත. වර්තමානයේ දී එය ආරක්ෂා කර ගැනීමට අභියෝග රැසකට මුහුණ දීමට සිදු වේ. ශ්‍රී ලංකාවේ ආදීවාසී ප්‍රජාවට පසුගිය අවුරුදු 2500 කට වඩා වැඩි කාලයක් තුළ විවිධ සංක්‍රමණයන්ට (immigration) සහා ජනපද කරණයන්ට (colonization) මුහුණදීමට සිදු වී ඇත. වර්තමානයේ දී මෙය ප්‍රබල ගැටලුවක් බවට පත්ව ඇත.

මුල් අවදියේ දී සමූහිකව ජිවත් වූ වැදි ජනතාවට රට තුළ ක්‍රියාත්මක කරණ ලද සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් විවිධ රාජ්‍ය නිළධාරින්ගේ මැදිහත්වීම මත නොයෙකුත් ප්‍රදේශයන්වලට සංක්‍රමණය වීමට ඇත. දානියගල, හේනේබැද්ද සහ බිංගොඩ යන පැරණි ජනාවාසවල ජිවත් වූ වැදි ජනතාව 1939 දී ඇති වූ මහා නියගයේ බලපෑමත් සමග වසංගත රෝගයන්වලට ලක් විය. පසුව දඹාන, රතුගල, පොල්ලේබැද්ද යන ප්‍රදේශවල පදිංචි කරවන ලදි. වර්තමානයේ ආදිවාසි ජනතාවගේ නිජ භූමියට බවට මෙම ප්‍රදේශයන් පත්ව ඇත. ශ්‍රී ලංකාවේ වාසය කළ මුල් පදිංචිකරුවන් අතරින් යම්කිසි අනන්‍යතාවක් යම් තරමකට හෝ රැකගෙන ජිවත්වන ජනකණ්ඩායමක් වශයෙන් වැදි ජනතාව හඳුනාගත හැකිය. සමාජය වෙනස් වීම යන විශ්වීය ක්‍රියාවලියෙන් ආරක්ෂා වීමට ශ්‍රී ලංකා ආදිවාසි ජනතාවට ද නො හැකි වී තිබේ. එ බැවින් ආදිවාසි සමාජයේ බෝහෝ පරිවර්ථන රැසකට ලක්ව ඇත. වර්තමානයේ දී ඔවුන්ට ආවේණික වූ යම් සංස්කෘතික ගතිකයක් ආරක්ෂා වී ඇත්නම් එය වැඩිහිටියන්ගේ පෙළඹවීම මත සිදුවුක් බව කිය යුතු ය.

තාක්‍ෂණික දියුණුවත් සමඟ සමාජය සීඝ්‍රයෙන් නවීකරණයට ලක් වේ. සියලුම ජන කොටස්වලට එක හා සමානව මේ තත්ත්වයට මුහුණු පෑමට සිදු වී ඇත. සාම්ප්‍රදායික ජිවිතයක් ගතකරන ආදිවාසී ජනයා උදෙසා කෙසේ බලපානු ලබන්නේ ද යන්න ඌව පළාතේ මොණරාගල රතුගල හා මහඔය පොල්ලේබැද්ද යන වැදි ගම්මාන ආශ්‍රයෙන් හඳුනාගත හැකි ය. වර්තමානය වනවිට ලෝකයේ සීග්‍රයෙන් ම වියැකී යන ජන කණ්ඩායම් බවට ශ්‍රී ලංකාවේ ආදිවාසී ජනතාව පත්ව ඇත. ඒ අනුව ප්‍රදේශයන් තුළ සිදු කරන ලද අධ්‍යයන තුළින් ඔවුන් මුහුණු පා ඇති ගැටලු රැසක් අවබෝධ කරගත හැකි විය.

සංස්කෘතික විපර්යාසය දෛනික ජන ජිවිතය ඇදහිලි හා විශ්වාස (ආවේණික) ආර්ථික පරිවර්තනය සමාජ ගැටලු රැසකට දිනෙන් දින මුහුණ දෙන වැදි ජනතාව එම ගැටලු හමුවේ දැඩි අභියෝගයකට ලක් ව ඇත. මෙම ජනතාවගේ උරුමය ආරක්ෂා කිරීමට වගකිව යුතු ආයතන ක්‍රියාත්මක නොවීම කනගාටුවට කරුණකි. ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ ව මෙන් ම ආදිවාසී ජනතාව සුරක්ෂිත කර ගැනීම උදෙසා යම්

ස්ථාවර වැඩපිළිවෙළක් අවශ්‍ය බව පෙන්වා දිය යුතු ය.

### ආශ්‍රිත ග්‍රන්ථ


හෙරත්, ආනන්ද. (2012)***පොල්ලේබැද්ද වැදි ජනතාව.*** නුගේගොඩ:සී/ස සරසවි ප්‍රකාශකයෝ.

බිනරගම, දයානන්ද. (2008)***බලංගොඩ මානවයා සහ අපේ ආදිවාසී වරිගේ ඇත්තෝ.*** කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ගුණවර්ධන, ප්‍රිශාන්ත., අදිකාරම්, ගාමිණී. (2010)***වැදිජන උරුමය.*** බත්තරමුල්ල: නෙප්චුන් ප්‍රකාශකයෝ.